# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2289/27 - 2022 ජූලි මස 20 වැනි බදාදා - 2022.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත**

නිවේදනය

ද්විත්ව බදුකරණයෙන් සහන සැලසීම සඳහා ද, බදු නොගෙවා පැහැර හැරීම වැළැක්වීම සඳහා ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ තුර්කි ජනරජයේ ආණ්ඩුව අතර 2022.01.28 වැනි දින එළඹි, මෙහි උපලේඛනයේ දක්වා ඇති ගිවිසුම 2022.03.24 වැනි දින සම්මත කර ගන්නා ලද යෝජනාව මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කොට ඇති බව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 75(1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**කේ. එම්. මහින්ද සිරිවර්ධන,**
ලේකම්,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

2022 ජූලි මස 20 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

උපලේඛනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ තුර්කි ජනරජයේ ආණ්ඩුව අතර ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු නොගෙවා මඟහැරීම වැළැක්වීම සඳහා වූ ගිවිසුම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ

තුර්කි ජනරජයේ ආණ්ඩුව

ආර්ථික සම්බන්ධතා තවදුරටත් වර්ධනය කිරීමේ සහ බදු කටයුතුවල සහයෝගිතාවය වර්ධනය කිරීමේ අභිප්‍රායෙන් යුතුව,


1A - G 37129 — 21 (2022/07)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බදු පැහැර හැරීම හෝ වැළැක්වීම හරහා බදුකරණය නොකිරීමට හෝ බදුකරණය අඩු කිරීමට අවස්ථා (මෙම ගිවිසුමෙන් සපයා ඇති සහන, තුන්වන රාජ්‍යයේ වාසිකයන් හට වක්‍ර ප්‍රතිලාභ ලබාගැනීමේ අපේක්ෂාවන් සහිත සම්මුති සොයායෑමේ සැකසුම් ද ඇතුළුව), නොසලසමින් ද්විත්ව බදුකරණය වැළැක්වීමේ අදහසින් ගිවිසුමකට එළඹීම සඳහා

මතු දැක්වෙන පරිදි එකඟ වී ඇත. :

1 වැනි වගන්තිය

**ආවරණය වන තැනැත්තන්**

1. ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක හෝ දෙකෙහිම වාසිකයන් වන තැනැත්තන් කෙරෙහි මෙම ගිවිසුම අදාළ විය යුතුය.

2. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකින් ඕනෑම එකක බදු නීති යටතේ සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මූල්‍ය විනිවිදභාවයෙන් යුක්තයැයි සලකනු ලබන අස්ථිත්වයක හෝ සැලසුමක් විසින් හෝ හරහා උපයන ආදායම, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුගේ ආදායම ලෙස සැලකිය යුත්තේ, එකී ආදායම එකී රාජ්‍යය විසින් බදුකරණ කාර්යයන් සඳහා සලකනු ලබන ප්‍රමාණයට පමණකි. ගිවිසුම්කාර රාජ්‍යයකට, එකී ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ගෙන් බදු අය කරගැනීම සඳහා වන අයිතියට, මෙම වගන්තියේ විධිවිධාන මගින් කිසිදු අවස්ථාවක දී බලපෑමක් ඇති විය හැකි බවට නොසැලකිය යුතුය.

2 වැනි වගන්තිය

**ආවරණය වන බදු**

1. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලනික උප කොට්ඨාසයක් හෝ එහි ප්‍රාදේශීය බල මණ්ඩල වෙනුවෙන් පනවනු ලබන ආදායම් මත වන බදු සම්බන්ධයෙන්, එය අය කෙරෙන ආකාරය පිළිබඳව නොසලකා මෙම ගිවිසුම අදාළ විය යුතුය.

2. චංචල හෝ නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලාභ මත වන බදු, ව්‍යවසායන් විසින් ගෙවනු ලබන මුළු වේතන සහ වැටුප් ප්‍රමාණයන් මත වන බදු ඇතුළුව, මුළු ආදායම මත හෝ එහි කොටසක් මත පනවනු ලබන සියලුම බදු, ආදායම් මත වන බදු වශයෙන් සැළකිය යුතුය.

3. මෙම ගිවිසුම අදාළ වන්නා වූ දැනට පවතින බදු වනුයේ :

(අ) තුර්කිය සම්බන්ධයෙන් ;

(i) ආදායම් බදු; සහ
(ii) සංස්ථා බදු;
(මෙහි මින්මතු ''තුර්කි බද්ද'' යනුවෙන් සඳහන් වේ);

(ආ) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්;

ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති ව්‍යවසායන් හි පිරිවැටුමේ ප්‍රතිශතයක් ලෙස ගෙවිය යුතු ආදායම් බදු ද ඇතුළුව, ආදායම් බද්ද,
(මෙහි මින්මතු ''ශ්‍රී ලංකා බද්ද'' යනුවෙන් සඳහන් වේ).

4. දැනට පවත්නා බදුවලට අතිරේකව හෝ ඒවා වෙනුවට මෙම ගිවිසුම අත්සන් කිරීමේ දිනයෙන් අනතුරුව පනවනු ලබන ඒ හා සමාන වූ හෝ බෙහෙවින් සමාන වූ වෙනත් යම් බදු වලට ද මෙම ගිවිසුම අදාල විය යුතුවේ. ගිවිසුම්කාර රාජ්‍යයන් හි නිසි බලධාරීන් ඔවුන්ගේ බදුකරණ නීති පිළිබඳව කරනු ලැබ ඇති ප්‍රධාන වෙනස්කම් සම්බන්ධයෙන් එකිනෙකාට දැනුම් දිය යුතුය.

3 වැනි වගන්තිය

**පොදු අර්ථ නිරූපන**

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා, පද සම්බන්ධය අනුව වෙනත් අයුරකින් තේරුම් ගත යුතු වුවහොත් මිස :

(අ) (i) ''තුර්කිය'' යන පදයෙන් ජීවී හෝ අජීවී කුමන හෝ දෑ සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතියට අනුකූලව ස්වභාවික සම්පත් ගවේෂණය, ප්‍රයෝජනයට ගැනීම සහ සංරක්ෂණ කාර්යයන් සඳහා තුර්කිය සිය ස්වෛරී අයිතිවාසිකම් සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන එහි භූමි ප්‍රදේශය, අභ්‍යන්තර ජල ප්‍රදේශ, දේශ සීමා මුහුද ද ඊට ඉහළින් පිහිටි ගුවන් අවකාශය මෙන්ම මහාද්වීප තටාකය ද ඇතුළත් වේ;

(ii) ''ශ්‍රී ලංකාව'' යන පදයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථ නිරූපනය කර ඇති පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත් ප්‍රදේශ අදහස් වන අතර, ඊට ජාත්‍යන්තර නීතියට හා ස්වකීය ජාතික ව්‍යවස්ථාවලට අනුකූලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් සිය ස්වෛරී අයිතිවාසිකම් සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන හෝ මින් මතුවට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි, එහි භූමි ප්‍රදේශය, අභ්‍යන්තර ජල ප්‍රදේශ සහ දේශ සීමා මුහුද ද ඊට ඉහළින් පිහිටි ගුවන් අවකාශ මෙන්ම අනන්‍ය ආර්ථික කලාපය හා මහාද්වීපික තටාකය ද ඇතුළත් වේ;

(ආ) ''ගිවිසුම්කාර රාජ්‍යය'' සහ ''අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය'' යන පදවලින් පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි තුර්කිය හෝ ශ්‍රී ලංකාව අදහස් කෙරේ;

(ඇ) ''තැනැත්තා'' යන පදයට යම් පුද්ගලයෙක්, සමාගමක් සහ වෙනත් යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ;

(ඈ) ''සමාගම'' යන පදයෙන් යම් සංස්ථාපිත මණ්ඩලයක් හෝ බදු කාර්යයන් සඳහා සංස්ථාපිත මණ්ඩලයක් ලෙස සලකනු ලබන යම් අස්ථිත්වයක් අදහස් කෙරේ;

(ඉ) ''ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක්'' සහ ''අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක්'' යන පදවලින් පිළිවෙළින් එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් අදහස් කෙරේ;

(ඊ) ''ජාත්‍යන්තර ගමනාගමනය'' යන පදයෙන්, ගිවිසුම්කාර රාජ්‍යයක යම් ව්‍යවසායක් විසින් මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් මගින්, එම නැව හෝ ගුවන් යානය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථානයන් අතර පමණක් ක්‍රියාත්මක කරන අවස්ථාවලදී හැර, කරනු ලබන ඕනෑම ප්‍රවාහනයක් අදහස් කෙරේ;

(උ) ''නිසි බලධාරියා'' යන පදයෙන් :

i. තුර්කිය සම්බන්ධයෙන්, භාණ්ඩාගාර සහ මුදල් අමාත්‍යවරයා හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු;
ii. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් හෝ කොමසාරිස් ජනරාල්වරයාගේ බලයලත් නියෝජිතයෙකු අදහස් කෙරේ;

(ඌ) ''ජාතිකයා'' යන පදයෙන් :

i. එකී ගිවිසුම්කාර රාජ්‍යයේ ජාතිකත්වය හෝ පුරවැසිභාවය හිමි පුද්ගලයෙකු; සහ
ii. ගිවිසුම්කාර රාජ්‍යයක බලපැවැත්වෙන නීති මගින් ස්වකීය තත්ත්වය ලබන යම් නෛතික තැනැත්තකු, හවුල් ව්‍යාපාරයක් හෝ සංගමයක්;

අදහස් කෙරේ.

(එ) ''බද්ද'' යන පදයෙන් පද සම්බන්ධය අනුව අවශ්‍ය පරිදි ශ්‍රී ලාංකීය බද්ද හෝ තුර්කි බද්ද අදහස් වන නමුත් මෙම ගිවිසුම අදාළ වන්නා වූ බදු වලට අදාළ යම් පැහැර හැරීමක් හෝ අත්හැරීමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු කිසියම් මුදලක් හෝ මෙම බදුවලට අදාළව පනවන ලද යම් දණ්ඩනයක් නියෝජනය කරන්නා වූ කිසියම් මුදලක් මෙයට ඇතුළත් නොවේ.

2. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් යම් අවස්ථාවක දී මෙම ගිවිසුමට අයත් විධිවිධාන යොදා ගැනීමේ දී වෙනත් අයුරකින් අර්ථකථනය කොට නොමැති කිනම් හෝ පදයක්, පද සම්බන්ධය අනුව වෙනස් අයුරකින් තේරුම් ගැනීම අවශ්‍ය වන්නේ නම් හෝ 24 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාවේ නැංවීමට අදාල වෙනත් තේරුමක් සඳහා නිසි බලධාරීන් එකඟ වන්නේ නම් මිස මෙම ගිවිසුමට අදාල වූ බදු පිළිබඳව එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ එම අවස්ථාවේ එම පදය දරන අර්ථයම දැරිය යුතු අතර, එම රාජ්‍යයේ බලපවත්නා වූ බදු නීති යටතේ දරන අර්ථය, එම රාජ්‍යයේ අනෙකුත් නීති යටතේ එම පදයට ඇති අර්ථය ඉක්මවා අදාළ විය යුතුය.

4 වැනි වගන්තිය

වාසිකයා

1. මෙම ගිවිසුමෙහි කාර්යයන් සඳහා ''ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයා'' යන පදයෙන් එකී රාජ්‍යයේ නීති යටතේ යම් තැනැත්තෙකුගේ නිත්‍ය වාසය, වාසස්ථානය, නෛතික ප්‍රධාන කාර්යාලය, නීතිගත වූ හෝ ලියාපදිංචි ස්ථානය, කළමනාකරණ ස්ථානය හෝ එවැනි සමාන ස්වභාවයක වෙනත් යම් නිර්ණායක හේතුවෙන් එම රාජ්‍යයේ දී බදු ගෙවීමට නියමිත යම් තැනැත්තෙකු අදහස් කෙරෙන අතර, එයට එම රාජ්‍යය සහ එහි යම් දේශපාලන උප කොට්ඨාසයක් හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයක් ද ඇතුළත් වේ. කෙසේ වුව ද, එම රාජ්‍යයේ ප්‍රභවයන්ගෙන් ලැබෙන ආදායම සම්බන්ධයෙන් පමණක් එම රාජ්‍යය තුළදී බද්දට යටත්වන යම් තැනැත්තෙකු, මෙම පදයට ඇතුළත් නොවේ.

2. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන යම් පුද්ගලයෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකුවන කල්හි, ඔහු පිළිබඳ තත්ත්වය පහත පරිදි තීරණය කළ යුතු ය :

(අ) ඔහුට නිත්‍ය වාසස්ථානයක් තිබෙන රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහුට රාජ්‍යයන් දෙකෙහිම නිත්‍ය වාසස්ථානයක් තිබේ නම් ඔහු සමග වඩා සමීප පෞද්ගලික හා ආර්ථික සම්බන්ධතා තිබෙන (ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන) රාජ්‍යයේ පමණක් ඔහු වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතුය;

(ආ) ඔහුගේ ඉතා වැදගත් සම්බන්ධතාවල කේන්ද්‍රස්ථානය වන රාජ්‍යය නිගමනය කළ නොහැකි නම් හෝ එක් ගිවිසුම්කාර රාජ්‍යයකවත් ඔහුට නිත්‍ය වාසස්ථානයක් නොතිබේ නම්, ඔහුට නිතර වාසය කරන වාසස්ථානයක් ඇති ගිවිසුම්කාර රාජ්‍යයේ පමණක් වාසිකයෙකු ලෙස ඔහු සළකනු ලැබිය යුතුය;

(ඇ) ඔහුට ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම නිතර වාසය කරන වාසස්ථානයක් තිබේ නම් හෝ ඉන් එකකවත් එවැන්නක් නොතිබේ නම්, ඔහු තමා ජාතිකයෙකුවන රාජ්‍යයේ දී පමණක් වාසිකයෙකු ලෙස සලකනු ලැබිය යුතුය;

(ඈ) ඔහු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම ජාතිකයෙකු වේ නම් හෝ ඉන් එකකවත් ජාතිකයෙකු නොවේ නම්, මෙම ප්‍රශ්නය ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යෝන්‍ය එකඟතාවයකින් යුතුව නිරාකරණය කරගනු ලැබිය යුතුය.

3. 1 වන ඡේදයේ විධිවිධාන හේතුකොට ගෙන තනි පුද්ගලයෙකු නොවන යම් තැනැත්තෙකු ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙහිම වාසිකයකුවන කල්හි, ගිවිසුමේ කාර්යයන් සඳහා ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධාරීන් විසින් අන්‍යෝන්‍ය එකඟතාවයකින් යුතුව, එවැනි තැනැත්තෙකුගේ නෛතික ප්‍රධාන කාර්යාලය, ක්‍රියාකාරී කළමනාකරණ ස්ථානය, නීතිගත වූ හෝ නැතිනම් සංස්ථාපිත හෝ ලියාපදිංචි වූ ස්ථානය සහ වෙනත් යම් අදාල සාධක පිළිබඳ සලකා බලා, කුමන ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු ලෙස සැලකිය යුතු ද යන්න තීරණය කළ යුතුය. එවැනි එකඟතාවයක් නොමැති අවස්ථාවකදී ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධාරීන් විසින් එකඟ වන ප්‍රමාණයට සහ ආකාරයට හැර මෙම ගිවිසුම මගින් සපයා ඇති යම් සහනයකට හෝ බදු නිදහස් කිරීමකට එවැනි තැනැත්තෙකු හිමිකම් නොලැබිය යුතුය.

5 වැනි වගන්තිය

ස්ථිර ආයතනය

1. මෙම ගිවිසුමේ කාර්යයන් සඳහා ''ස්ථිර ආයතනය'' යන පදයෙන් ව්‍යවසායෙහි ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම හෝ ඉන් කොටසක් කරගෙන යනු ලබන ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් අදහස් කෙරේ.

2. ''ස්ථිර ආයතනය'' යන පදයට විශේෂයෙන් :

(අ) කළමනාකරණ ස්ථානයක්;
(ආ) ශාඛාවක්;
(ඇ) කාර්යාලයක්;
(ඈ) කර්මාන්ත ශාලාවක්;
(ඉ) වැඩපොළක්;

(ඊ) පතලක්, තෙල් හෝ ගෑස් ආකරයක්, ගල් වලක් හෝ ස්වභාවික සම්පත් නිස්සාරණය කෙරෙන වෙනත් යම් ස්ථානයක්; සහ

(උ) අලෙවි සැලක් ලෙස යොදගන්නා පරිශ්‍රයක්,

ඇතුළත් වේ.

3. ''ස්ථිර ආයතනය'' යන පදයෙන් ඉහත අයුරින්ම :

(අ) ගොඩනැගිලි වැඩබිමක්, ඉදිකිරීමේ, එකලස් කිරීමේ හෝ සවිකිරීමේ ව්‍යාපෘතියක් හෝ ස්වභාවික සම්පත් ගවේෂණය කිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා භාවිතා කරනු ලබන විදීමේ වේදිකාවක් හෝ නැවක්, ඒ හා සම්බන්ධ අධීක්ෂණ කටයුතු ද ඇතුළුව, එහෙත් එම වැඩ බිම, ව්‍යාපෘතිය හෝ එහි කටයුතු සලකනු ලබන මුල්‍ය වර්ෂයකින් ආරම්භ හෝ අවසානයේ යම් දොළොස් මසක කාල පරිච්ඡේදයක් තුළ දින 183 කට වැඩි කාලයක් පවතී නම් පමණක් ;

(ආ) ව්‍යවසායක් විසින් එකී කාර්යය සඳහා සේවකයන් හෝ වෙනත් සේවක පිරිස් යොදවා උපදේශන සේවාවන්ද ඇතුළුව සේවාවන් සැපයීම, එහෙත් එබඳු ස්වභාවයේ කටයුතු ගිවිසුම්කාර රාජ්‍යය තුළ කිසියම් මුල්‍ය වර්ෂයකින් ආරම්භ හෝ අවසාන වන යම් දොළොස් මසක කාලපරිච්ඡේදයක් තුළ එකතුව දින 183ක් ඉක්මවන කාල පරිච්ඡේදයක් හෝ කාල පරිච්ඡේද සඳහා පවතී නම් පමණක්,

අදහස් වේ.

4. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් හි කුමක් සඳහන් වුව ද, ''ස්ථිර ආයතනය'' යන පදයට :

(අ) ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පහසුකම් පාවිච්චි කිරීම;

(ආ) ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය තොග, ගබඩා කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා පමණක් පවත්වාගෙන යාම;

(ඇ) වෙනත් ව්‍යවසායක් විසින් සකස් කිරීමේ කාර්යය සඳහා පමණක් ව්‍යවසායට අයත් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය තොග පවත්වාගෙන යාම;

(ඈ) ව්‍යවසාය සඳහා භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ හෝ තොරතුරු රැස්කිරීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

(ඉ) ව්‍යවසාය වෙනුවෙන් හුදෙක් ප්‍රාරම්භක ස්වරූපයක් ගන්නා වෙනත් යම් කටයුත්තක් කරගෙන යනු ලැබීමේ කාර්යය සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

(ඊ) උපඡේද (අ) සිට (ඉ) දක්වා සඳහන් කරන ලද කාර්යයන්ගේ ඕනෑම එකතුවක් සඳහා පමණක් ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් පවත්වාගෙන යාම;

එවැනි ක්‍රියාකාරකමක් හෝ උපඡේදය (ඊ) වැනි අවස්ථාවක දී සමස්ථ ක්‍රියාකාරකම හුදෙක් ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් ගන්නේ නම්, ඇතුළත් නොවන ලෙස සැලකිය යුතුය.

5. එකම ස්ථානයේ ව්‍යවසායන් දෙකක් විසින් හෝ, ස්ථාන දෙකක එකම ව්‍යවසාය හෝ සමීප ලෙස සම්බන්ධිත ව්‍යවසායන් දෙකක් විසින්, පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර කටයුතු සංයුක්ත ව්‍යාපාර මෙහෙයුමක කොටසක් වන අනුපූරක ක්‍රියාකාරකම් වලින් සමන්විත වන්නේ නම්,

එකම ගිවිසුම්කාර රාජ්‍යයේ එකම ස්ථානයකදී හෝ වෙනත් ස්ථානයක දී, ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන, ව්‍යවසායක් හෝ සමීප ලෙස සම්බන්ධිත ව්‍යවසායක් නම්, සහ ;

(අ) මෙම වගන්තියේ විධිවිධාන යටතේ එකී ස්ථානය හෝ වෙනත් ස්ථානය ව්‍යවසාය හෝ සමීප ලෙස සම්බන්ධිත ව්‍යවසායන් සඳහා, ස්ථිර ආයතනයක් වීම, හෝ

(ආ) ව්‍යවසායන් දෙකක් විසින් එකම ස්ථානයක හෝ එකම ව්‍යවසාය හෝ සමීප ලෙස සම්බන්ධිත ව්‍යවසායන් දෙකක් විසින් ස්ථාන දෙකක පවත්වාගෙන යනු ලබන කාර්යයන්ගේ එකතුවේ ප්‍රතිඵලයක් වන සමස්ත කාර්යය ප්‍රාරම්භක හෝ සහායක ස්වරූපයක් නොගන්නා විට,

එම ව්‍යවසාය විසින් ප්‍රයෝජනයට ගනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන ස්ථිර ව්‍යාපාරික ස්ථානයකට, 4 වන ඡේදය අදාල නොවේ.

6. 8 වැනි ඡේදය අදාල වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයකු වන තැනැත්තෙකු හැර යම් තැනැත්තකු ගිවිසුම්කාර රාජ්‍යයකදී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් වෙනුවෙන් ක්‍රියාකරන අවස්ථාවක දී;

(අ) එම තැනැත්තාගේ කටයුතු ස්ථිර ව්‍යාපාරික ස්ථානයක් මගින් ක්‍රියාත්මක කළේ වුවද එය ස්ථිර ආයතනයක් බවට පත් නොකරන්නා වූ 4 වැනි ඡේදයේ සඳහන් කටයුතුවලට සීමා වන්නේ නම් මිස ව්‍යවසාය වෙනුවෙන් ගිවිසුම්වලට එළඹීමේ බලයක් ඇත්තාවූ ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේ දී එම බලය සිරිතක් වශයෙන් ක්‍රියාත්මක කරන්නා වූ ද තැනැත්තෙකු;

(ආ) එවැනි බලයක් නොමැති වුවත්, පළමු සඳහන් රාජ්‍යයේ දී සිරිතක් වශයෙන් පවත්වාගෙන යන්නා වූ භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය තොගයකින් ව්‍යවසාය වෙනුවෙන් නිරතුරුව භාණ්ඩ හෝ වෙළෙඳ ද්‍රව්‍ය නිකුත් කරන්නා වූ ද තැනැත්තෙකු, වන්නේ නම් 1 වැනි හා 2 ඡේදවල විධිවිධාන කුමක් වුවද එම තැනැත්තා ව්‍යවසාය වෙනුවෙන් භාරගන්නා වූ යම් කටයුතු සම්බන්ධයෙන් එම ව්‍යවසායට පළමු සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්ථිර ආයතනයක් ඇති ලෙස සැලකිය යුතුය.

7. ප්‍රතිරක්ෂණ සම්බන්ධයෙන් හැර, ගිවිසුම්කාර රාජ්‍යයක රක්ෂණ ව්‍යවසායක් 8 වැනි ඡේදය අදාල වන ස්වාධීන තත්ත්වයේ නියෝජිතයෙකු වන්නා වූ තැනැත්තෙකු හැර වෙනත් තැනැත්තෙකු මගින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ භූමි ප්‍රදේශය තුළ වාරික එකතු කරන්නේ නම් හෝ එම භූමි ප්‍රදේශය තුළ පවතින යම් අවදානම් රක්ෂණය කරන්නේ නම්, මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් නොසළකා එයට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ස්ථිර ආයතනයක් තිබේ යයි සළකනු ලැබිය යුතුය.

8. ස්වකීය සාමාන්‍ය ක්‍රියාපටිපාටිය අනුව ක්‍රියා කරන තැරැව්කරුවෙකු, සාමාන්‍ය කොමිස් නියෝජිතයෙකු හෝ ස්වාධීන තත්ත්වයක් දරන වෙනත් යම් නියෝජිතයෙකු මගින් යම් රාජ්‍යයක ව්‍යාපාරික කටයුතු කරගෙන යන හේතුව නිසාවෙන්ම එම රාජ්‍ය තුළ ස්ථිර ආයතනයක් ඇති බව නොසැළකිය යුතුය. කෙසේ නමුදු, යම් පුද්ගලයෙක් සමීපවම සම්බන්ධ වී ඇති ව්‍යවසායන් එකක් හෝ වැඩි ගණනක් වෙනුවෙන් තනිවම හෝ සම්පූර්ණයෙන්ම පාහේ තනිවම ක්‍රියා කරන විට මෙම ඡේදයේ අර්ථය තුළ එවැනි යම් ව්‍යවසායක් සම්බන්ධයෙන් එකී පුද්ගලයා ස්වාධීන නියෝජිතයෙකු ලෙස නොසැලකේ.

9. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික සමාගමක්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික සමාගමක් පාලනය කිරීම හෝ එවැනි සමාගමක් විසින් පාලනය කරනු ලැබීම හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යාපාරයන් (ස්ථිර ආයතනයක් මගින් හෝ වෙනත් යම් ආකාරයකට) කරගෙන යාම නිසාවෙන් ම එක් සමාගමක් අනෙකෙහි ස්ථිර ආයතනයක් නොවිය යුතුය.

10. අදාල සියළුම කරුණු සහ තත්ත්වයන් මත යමෙකුට අනෙකාගේ පාලනය තිබේ නම් හෝ දෙදෙනාම එකම පුද්ගලයන් හෝ ව්‍යවසායන් යටතේ පාලනය වේ නම් මෙම වගන්තියේ කාර්යයන් සඳහා යම් පුද්ගලයෙකු හෝ ව්‍යවසායක්, යම් ව්‍යවසායකට සමීපව සම්බන්ධ වේ යැයි සැලකේ. යමෙකු ඍජුව හෝ වක්‍රව, අනෙකාගේ ප්‍රතිලාභමය අයිතිවාසිකමෙන් සියයට 50 කට වඩා හිමිකාරිත්වය දරයි (සමාගමක් සම්බන්ධයෙන් සමාගමේ කොටස්වල සමස්ත ඡන්දය සහ වටිනාකම හෝ සමාගමේ ප්‍රතිලාභ ස්කන්ධ පොළිය සියයට 50ට වැඩි වන අවස්ථාවක දී) නම්, හෝ පුද්ගලයෙකුගේ සහ ව්‍යවසායක හෝ ව්‍යවසායන් දෙකෙහි ප්‍රතිලාභමය අයිතිවාසිකමෙන් සියයට 50 කට වඩා වෙනත් පුද්ගලයෙකු හෝ ව්‍යවසායක් හිමිකාරීත්වය (සමාගමක් සම්බන්ධයෙන් සමාගමේ කොටස්වල සමස්ත ඡන්දය සහ වටිනාකම හෝ සමාගමේ ප්‍රතිලාභ ස්කන්ධ පොළිය සියයට 50ට වැඩි වන අවස්ථාවකදී) දරයි නම්, එවැනි ඕනෑම අවස්ථාවකදී පුද්ගලයෙකු හෝ ව්‍යවසායක් සමීප ලෙස සම්බන්ධ යැයි සලකනු ලැබිය යුතුය.

## 6 වැනි වගන්තිය

## නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායම

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි නිශ්චල දේපළවලින් (කෘෂිකර්මයෙන් හෝ වන වගාවෙන් ලබන ආදායමද ඇතුළුව) ලබන ආදායම එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. ''නිශ්චල දේපල'' යන පාඨයට, ප්‍රශ්නගත දේපළ පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිය යටතේ එම පාඨය දරන අර්ථයම තිබිය යුතුය. කුමන අවස්ථාවක දී වුවද මෙම පාඨයට නිශ්චල දේපළවලට අනුබද්ධ වන දේපළ, පශු සම්පත් සහ කෘෂිකර්මයෙහි දී සහ වන වගාවෙහි දී පාවිච්චි කරන උපකරණ, ඉඩකඩම් දේපළ සම්බන්ධ සාමාන්‍ය නීතියේ විධිවිධාන අදාල අයිතිවාසිකම්, නිශ්චල දේපළවල භුක්තිය සහ ඛනිජ නිධි, ප්‍රභවයන් සහ වෙනත් ස්වාභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම හෝ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකම් සඳහා ප්‍රතිෂ්ඨා වශයෙන් විචල්‍ය හෝ ස්ථිර ගෙවීම් ලැබීමේ අයිතිවාසිකම් ද ඇතුළත් විය යුතු අතර නැව් සහ ගුවන් යානා නිශ්චල දේපළ ලෙස නොසැලකිය යුතුය.

3. නිශ්චල දේපළ කෙළින්ම ප්‍රයෝජනයට ගැනීමෙන්, කුලියට දීමෙන් හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රයෝජනයට ගැනීමෙන් ලැබෙන ආදායමට මෙම වගන්තියේ 1 වැනි ඡේදයේ විධිවිධාන අදාල විය යුතුය.

4. 1 වැනි සහ 3 වැනි ඡේදවල විධිවිධාන, යම් ව්‍යවසායක නිශ්චල දේපළවලින් ලැබෙන ආදායමට ද, ස්වාධීන පෞද්ගලික සේවා කරගෙන යාම සඳහා උපයෝගී කරගන්නා නිශ්චල දේපළවලින් ලැබෙන ආදායමට ද අදාල විය යුතුය.

## 7 වැනි වගන්තිය

## ව්‍යාපාර ලාභ

1. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වකීය ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන්නේ නම් මිස, එම ව්‍යවසායෙහි ලාභ බද්දට යටත් කළ හැකි වන්නේ එකී රාජ්‍යයෙහි දී පමණකි. ව්‍යවසාය ඉහත කී පරිදි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන්නේ නම් ව්‍යවසායෙහි ලාභ අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි නමුත්, එසේ බද්දට යටත් කළ හැකි වන්නේ, (අ) එම ස්ථිර ආයතනයට, (ආ) එකී ස්ථිර ආයතනය හරහා විකුණනු ලැබූ ද්‍රව්‍ය හා සමාන හෝ අනුරූපී ආකාරයේ එකී අනෙක් රාජ්‍යයේදී විකුණනු ලැබූ බඩු හෝ වෙළඳ භාණ්ඩයන්ට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට පමණකි.

2. 3 වැනි ඡේදයේ විධිවිධාන වලට යටත්ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින්, එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වකීය ව්‍යාපාර පවත්වාගෙන යන අවස්ථාවක දී එම ස්ථිර ආයතනය, එය ස්ථිර ආයතනයක් වන්නේ කවර ව්‍යවසායක ද, එම ව්‍යවසාය සමග එම තත්ත්වයෙන් හෝ සමාන තත්ත්වයන් යටතේ, එම කටයුතුවල හෝ ඒ හා සමාන කටයුතුවල සම්පූර්ණයෙන්ම, ස්වාධීනව නිරතවන වෙනත් හා වෙන් වූ ව්‍යවසායක් වූයේ නම් ඊට ලැබෙතැයි අපේක්ෂා කළ හැකි ලාභ, එම ස්ථිර ආයතනයට ලැබුණු ලෙස එක් එක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී සළකනු ලැබිය යුතුය.

3. ස්ථිර ආයතනයක ලාභ තීරණය කිරීමේ දී, විධායක සහ පොදු පරිපාලන වියදම් ද ඇතුළුව එම ස්ථිර ආයතනයේ ව්‍යාපාරික කාර්යයන් සඳහා දරන ලද වියදම් එම ස්ථිර ආයතනය පිහිටි රාජ්‍යයෙහි හෝ වෙනත් ස්ථානයක දී දරනු ලැබුවේ වුවද, ඒවා අඩු කිරීම් ලෙස ඉඩදිය යුතුය.

4. ව්‍යාපාරයේ මුළු ලාභය එහි විවිධ කොටස්වලට විභාජනය කිරීමේ ක්‍රමය පදනම් කොටගෙන ස්ථිර ආයතනයකට ආරෝපණය කළයුතු ලාභ නිර්ණය කිරීම ගිවිසුම්කාර රාජ්‍යයක සිරිතක්ව පවතිනතාක් කල් මෙම වගන්තියේ 2 ඡේදයෙහි ඇති කිසිවක් එම ගිවිසුම්කාර රාජ්‍ය එසේ සිරිත් පරිදි කළහැකි විභජනය කිරීම මගින් බදු අය කළ හැකි ලාභ නිර්ණය කිරීමෙන් නොවැළක්විය යුතුය. කෙසේවුවද, අනුගමනය කරන විභජනය කිරීමේ ක්‍රමය මෙම වගන්තියේ ඇතුළත් මූලධර්මයන්ට අනුකූල වන ප්‍රතිඵලය ඇති කරන්නක් විය යුතුය.

5. යම් ස්ථිර ආයතනයක් විසින් ව්‍යවසාය සඳහා හුදෙක් භාණ්ඩ හෝ වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීම හේතුවෙන් යම් ලාභයක් එකී ස්ථිර ආයතනයට අරෝපණය නොකළ යුතුය.

6. එසේ නොකිරීමට සුදුසු හා ප්‍රමාණවත් හේතු ඇත්තේ නම් මිස, ඉහත කී ඡේදයන්හි කාර්යයන් සඳහා, වර්ෂයෙන් වර්ෂයට එකම ක්‍රමයක් මගින් ස්ථිර ආයතනයකට ආරෝපණය කළ යුතු ලාභය තීරණය කළ යුතුය.

7. මෙම ගිවිසුමෙහි වෙනත් වගන්තිවල වෙනම සඳහන් කරනු ලැබ ඇති ආදායම් අයිතම ලාභයන්හි ඇතුළත් වන අවස්ථාවක දී, එකී වගන්තිවල විධිවිධාන සම්බන්ධයෙන් මෙම වගන්තියේ විධිවිධාන බල නොපෑ යුතුය.

## 8 වැනි වගන්තිය

## නාවික සහ ගුවන් ප්‍රවාහනය

1. ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා නැව් මෙහෙයුම් කිරීමෙන් එක් ගිවිසුම්කාර රාජ්‍යයක දී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක් විසින් ලබන ලාභ පළමුව සඳහන් කරන ලද රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකි නමුත්, එසේ අය කරනු ලබන බද්දෙන් සියයට 50කට සමාන ප්‍රමාණයක් අඩු කළ යුතුය.

2. ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා ගුවන් යානා මෙහෙයුම් කිරීමෙන් උපයනු ලබන ලාභ එම ගුවන්යානා මෙහෙයුම් සිදු කරන ව්‍යවසාය වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතුය.

3. කිසියම් සංචිතයකට සහභාගී වීමෙන්, බද්ධ ව්‍යාපාරයකින් හෝ ජාත්‍යන්තර මෙහෙයුම් නියෝජිතායතනයකින් ලැබෙන ලාභ වලටද, 1 හා 2 වැනි ඡේදයන්හි විධිවිධාන අදල විය යුතුය.

**9 වැනි වගන්තිය**

**සම්බන්ධිත ව්‍යවසායන්**

1. (අ) ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනය සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍ර ලෙස සහභාගී වන අවස්ථාවක, හෝ

(ආ) එකම තැනැත්තන් එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක කළමනාකරණයට, පාලනයට හෝ ප්‍රාග්ධනයට ඍජුව හෝ වක්‍ර ලෙස සහභාගි වන අවස්ථාවක, සහ

ඒ අවස්ථා දෙකින් කවර අවස්ථාවක දී වුවද, ස්වාධීන ව්‍යවසායන් අතර පවත්නා වාණිජ්‍ය හා මූල්‍ය සම්බන්ධතා පිළිබඳ කොන්දේසිවලට වෙනස් කොන්දේසි ඒ ව්‍යවසායන් දෙක අතර පිළියෙළ කර හෝ පනවා ඇති කල්හි, ඒ කොන්දේසි නොතිබුණි නම්, ඒ ව්‍යවසායන්ගෙන් එකකට උපචිත විය හැකි වූ නමුත්, ඒ කොන්දේසි නිසා එසේ උපචිත නොවූ කවර ලාභ වුව ද, ඒ ව්‍යවසායේ ලාභවලට ඇතුළත් කර, ඒ අනුව ලාභ මත බදු අය කළ හැකිය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක් එම රාජ්‍යයේ ව්‍යවසායක ලාභයට ඇතුළත් කරනු ලබන සහ බද්දට යටත් කරනු ලබන ලාභ, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ව්‍යවසායක ලාභයෙහි ඇතුළත් කරනු ලැබ එම අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, සහ එසේ ඇතුළත් කර ඇති ලාභ, ව්‍යවසායන් දෙක අතර ඇති කරගත් කොන්දේසි ස්වාධීන ව්‍යවසායන් අතර ඇති කරගත හැකිව තිබූ කොන්දේසිම වන විටක, පළමුව සඳහන් කර ලද රාජ්‍යයේ ව්‍යවසායකට උපචිත විය හැකිව තිබූ ලාභවන්නේ නම් එවිට එම ලාභ මත අයකරනු ලබන බදු ප්‍රමාණයට යෝග්‍ය ගැලපුමක්, එම ගැලපුම සාධාරණ යැයි සැළකෙන්නේ නම් එම අනෙක් රාජ්‍යය විසින් කළ යුතුය. එවැනි ගැලපුමක් තීරණය කිරීමේ දී, මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධාන කෙරෙහි ද නිසි අවධානය යොමු කළ යුතු අතර, අවශ්‍ය වන්නේ නම්, ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධාරීන් එකිනෙකා විමසිය යුතු වන්නේ ය.

3. සලකනු ලබන එක් ව්‍යවසායක් වංචාව, දැඩි නොසැලකිල්ල හෝ හිතාමතා පැහැර හැරීම සම්බන්ධයෙන් දණ්ඩනයකට බැඳී සිටින පරිදි 1 වන ඡේදය යටතේ ලාභයේ ගැලපුමකට තුඩු දෙන ක්‍රියාකාරකම් මගින් අවසාන විනිශ්චයක දී අධිකරණමය, පරිපාලනමය, හෝ වෙනත් නෛතිමය පටිපාටියක් ප්‍රතිඵලය වන අවස්ථාවක දී 2 වන ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතුය.

**10 වැනි වගන්තිය**

**ලාභාංශ**

1. එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන ලාභාංශ එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. කෙසේ වුවද, ලාභාංශ ගෙවන සමාගම ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන අවස්ථාවකදී ගිවිසුම්කාර රාජ්‍යයේ නීතිවලට අනුකූලව එවැනි ලාභාංශවලින් බදු අය කළ හැකි නමුත්, ලාභාංශවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අය කරන බද්ද ;

(අ) අර්ථලාභී හිමිකරු ලාභාංශ ගෙවනු ලබන සමාගමේ ප්‍රාග්ධනයෙන් අවම වශයෙන් සියයට 10 ක් වත් අයිතිය දරන සමාගමක් වේ නම් දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 7.5කට ද;

(ආ) අන් සියළුම අවස්ථාවක දී දළ ලාභාංශ ප්‍රමාණයෙන් සියයට 10 කට ද;

වැඩි නොවිය යුතුය.

ලාභාංශවලින් සමන්විත වූ ලාභ මත බදුකරණයට යටත් වන සමාගම් සම්බන්ධයෙන් මෙම ඡේදය බල නොපෑ යුතුය.

3. මෙම වගන්තියෙහි යොදා ගනු ලැබ ඇති පරිදි ''ලාභාංශ'' යන පදයෙන් කොටස්, Jouissance කොටස් හෝ Jouissance අයිතීන්, ආරම්භකයන්ගේ කොටස්වලින් හෝ ණය හිමිකම් නොවන්නා වූ වෙනත් අයිතිවාසිකම්වලින් ලාභයට සහභාගීවීමෙන් ලබන ආදායම මෙන්ම, බෙදාහැරීම කරනු ලබන සමාගම වාසික වන රාජ්‍යයේ නීති මගින් කොටස්වලින් ලබන ආදායම බදුකරණයට භාජනය කරනු ලබන ආකාරයටම බදුකරණයට යටත් වන්නා වූ, වෙනත් සංස්ථාපිත අයිතිවාසිකම් වලින් ලබන ආදායම අදහස් කෙරේ.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ ලාභාංශවල අර්ථලාභී හිමිකරු, ලාභාංශ ගෙවන සමාගම වාසික වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එම ව්‍යාපාර කටයුතු කරගෙන යන්නේ නම් හෝ එහි පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී ස්වාධීන පෞද්ගලික සේවා ඉටු කරන්නේ නම් සහ ලාභාංශ ගෙවනු ලබන කොටස් දරන සමාගම එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමග ඵලදායී ලෙස සම්බන්ධව පවතී නම්, 1 වන හා 2 වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතුය. එවැනි අවස්ථාවන්හි දී අවස්ථාවෝචිත පරිදි 7 වන වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතුය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසික වන සමාගමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙන් ලාභ හෝ ආදායම් උපයන අවස්ථාවකදී, එම සමාගම ගෙවන ලාභාංශ එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විටෙක හැර හෝ එම අනෙක් රාජ්‍යයේ පිහිටි ඵලදායී ලෙස සම්බන්ධ වී ඇති ස්ථිර ආයතනයක් සම්බන්ධයෙන් වන විටෙක හැර, සමාගම විසින් ගෙවනු ලබන ලාභාංශ සම්බන්ධයෙන් බදු කිසිවක් එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍ය විසින් නොපනවා සිටිය හැකිවාක් මෙන්ම, සමාගමේ ගෙවන ලද ලාභාංශ හෝ එහි නොබෙදූ ලාභ එම අනෙක් රාජ්‍යයෙහි පැන නගින ලාභ හෝ ආදායම්වලින් මුළු හෝ අඩ වශයෙන් සමන්විත වන්නේ වුවද සමාගමේ නොබෙදූ ලාභ, සමාගමේ නොබෙදූ ලාභ මත වන බද්දකට භාජනය නොකර ද සිටිය හැකිය.

## 11 වැනි වගන්තිය

## පොළිය

1. ගිවිසුම්කාර රාජ්‍යයක දී උද්ගත වන පොළිය අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන විටෙක දී එම පොළිය එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. කෙසේවුවද, එම පොළියෙන් එය උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී ද, එම රාජ්‍යයේ නීතිය අනුව බදු අයකළ හැකි නමුත්, පොළියේ අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වේ නම්, එසේ අයකරනු ලබන බද්ද දළ පොළී ප්‍රමාණයෙන් සියයට 10ක් නොඉක්මවිය යුතුය.

3. මෙම වගන්තියේ 2 වැනි ඡේදයේ විධිවිධානයන් හි කුමක් සඳහන් වුව ද ගිවිසුම්කාර රාජ්‍යයක දී උද්ගත වන්නා වූ සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ යම් දේශපාලන උප කොට්ඨාසයක් හෝ පළාත් පාලන ආයතනයක්, මහ බැංකුව හෝ එම රජය මගින් සම්පූර්ණයෙන්ම පාලනය වන මූල්‍යායතනයක් ඇතුළුව එම රජය විසින් උපයාගන්නා වූ පොළිය මුලින් සඳහන් කළ රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතුය.

4. මෙම වගන්තියේ යෙදී ඇති ''පොළිය'' යන පදයෙන්, උකසක් මගින් ඇප තබා ඇති හෝ නැති, සහ ණයගැතියාගේ ලාභවලට සහභාගීවීමේ අයිතිවාසිකම් සහිත හෝ රහිත, සියළු වර්ගයන් හි ණය හිමිකම්වලින් ලැබෙන ආදායම සහ විශේෂයෙන් රජයේ සුරැකුම්පත් වලින් ලැබෙන ආදායම සහ බැඳුම්කර හෝ ඍණපත්‍ර වලින් ලැබෙන ආදායම එවැනි සුරැකුම්පත්, බැඳුම්කර හෝ ඍණපත්‍රවලට බැඳී ඇති අධි මිල සහ ත්‍යාග ද ඇතුළත්ව අදහස් වේ. මෙම වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රමාද ගෙවීම් වෙනුවෙන් අය කරන දණ්ඩන ගාස්තු පොළිය ලෙස සළකනු නොලැබිය යුතුය.

5. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නා වූ පොළී ආදායමෙහි අර්ථලාභී හිමිකරු, පොළිය උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් එහි ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන්නේ නම් හෝ එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටා ඇති ස්ථාවර පදනමක් මගින් එම රාජ්‍යයේ දී ස්වාධීන පෞද්ගලික සේවාවන් ඉටුකරන්නේ නම් සහ පොළිය ගෙවනු ලබන ණය හිමිකම, එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ, ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත්නම්, 1 වන සහ 2 වන ඡේදවල විධිවිධාන අදාල නොවිය යුතුය. එවැනි අවස්ථාවල දී මෙම ගිවිසුමේ 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි අදාල විය යුතුය.

6. පොළිය ගෙවන්නා එම රාජ්‍යයේ වාසිකයෙකු වන කල්හි, පොළිය එම රාජ්‍යයේ දී උද්ගත වන ලෙස සැළකිය යුතුය. කෙසේ වෙතත් පොළී ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුවද, නොවුවද, ඔහුට පොළිය ගෙවීමට හේතු වූ ණයගැතිභාවය හා සම්බන්ධ වූ ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක තිබෙන අවස්ථාවක දී සහ එම පොළිය දරනු ලබන්නේ එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් නම්, එවිට ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම තිබෙන රාජ්‍යයේ දී එම පොළිය උද්ගත වන ලෙස සැළකිය යුතුය.

7. ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනා සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධයක් නිසා ගෙවනු ලබන පොළී ප්‍රමාණය, එවැනි සම්බන්ධයක් නොමැති අවස්ථාවක දී ණය හිමිකම සැළකිල්ලට ගනිමින් ගෙවන්නා සහ අර්ථලාභී හිමිකම් ඇති තැනැත්තා විසින් එකග විය හැකිව තිබූ ප්‍රමාණය ඉක්මවන්නේ නම්, මෙම වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුත්තේ අවසානයට සඳහන් කළ ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක ගෙවීම්වල අතිරික්ත කොටස, මෙම

ගිවිසුමේ අනෙක් විධිවිධාන සුදුසු පරිදි සැළකිල්ලට ගනිමින්, ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව තවදුරටත් බද්දට යටත් විය යුතුය.

12 වැනි වගන්තිය

**රාජ්‍යභාග**

1. ගිවිසුම්කාර රාජ්‍යයක උද්ගතවන සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වෙත ගෙවනු ලබන රාජ්‍යභාග, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකි ය.

2. කෙසේ වෙතත්, එම රාජ්‍යභාග, ඒවා උද්ගත වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුව බද්දට යටත් කළ හැකි නමුත් රාජ්‍යභාගවල අර්ථලාභී හිමිකරු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, එසේ අයකෙරෙන බද්ද, එම රාජ්‍යභාගවල දළ ප්‍රමාණයෙන් 10% නොඉක්මවිය යුතුය.

3. මෙම වගන්තියේ යොදා ඇති පරිදි ''රාජ්‍යභාග'' යන පදයෙන් සිනමා රූපක චිත්‍රපට හෝ ගුවන් විදුලි හෝ රූපවාහිනී විකාශනය සඳහා යොදගන්නා පටල හෝ හඬපටි ඇතුළු කිසියම් සාහිත්‍යමය, කලාත්මක හෝ විද්‍යාත්මක කෘතියක ප්‍රකාශන අයිතියක්, පේටන්ට් බලපත්‍රයක්, වෙළඳ සලකුණක්, මෝස්තරයක් හෝ ආදර්ශකයක්, පිඹුරක්, රහස් වට්ටෝරුවක් හෝ ක්‍රියාවලියක් හෝ කාර්මික, වාණිජමය හෝ විද්‍යාත්මක උපකරණ හෝ කාර්මික, වාණිජමය හෝ විද්‍යාත්මක අත්දැකීමක් සම්බන්ධ තොරතුරු, භාවිතා කිරීමට හෝ භාවිතා කිරීමේ අයිතිය සඳහා ප්‍රතිෂ්ඨාවක් වශයෙන් ලැබුණු ඕනෑම වර්ගයක ගෙවීම් අදහස් කෙරේ.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වන්නාවූ රාජ්‍යභාග වල අර්ථලාභී හිමිකරු, රාජ්‍යභාග උද්ගත වන අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී එහි පිහිටි ස්ථිර ආයතනයක් මගින් ව්‍යාපාරයක් කරගෙන යන අවස්ථාවක හෝ එම අනෙක් රාජ්‍යය තුළ පිහිටි ස්ථාවර පදනමක් මගින් ස්වාධීන පෞද්ගලික සේවා පවත්වාගෙන යන අවස්ථාවක සහ රාජ්‍යභාග ගෙවනු ලබන්නේ කවර අයිතිවාසිකමක් හෝ දේපළක් සම්බන්ධයෙන් ද, එම අයිතිවාසිකම හෝ දේපළ, එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම සමඟ ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම් මෙම වගන්තියේ 1 වැනි හා 2 වැනි ඡේදවල විධිවිධාන අදල නොවිය යුතුය. එවැනි අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, 7 වැනි වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අදල විය යුතුය.

5. ගෙවන්නා එම රාජ්‍යයේ වාසිකයෙකු වන කල්හි, රාජ්‍යභාග එම ගිවිසුම්කාර රාජ්‍යයේ උද්ගත වන ලෙස සැළකිය යුතුය. එසේ වුවද, රාජ්‍යභාග ගෙවන්නා වූ තැනැත්තා ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු වුවද, නොවුවද, රාජ්‍යභාග උද්ගතවීමට තුඩුදෙන අයිතියක් හෝ දේපළක් සමග ඵලදායී ලෙස බැඳුනු ස්ථිර ආයතනයක් හෝ ස්ථාවර පදනමක් ගිවිසුම්කාර රාජ්‍යයක ඔහු සතුව තිබේ නම් සහ එම රාජ්‍යභාග එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම විසින් දරනු ලබන්නේ නම්, එවැනි අවස්ථාවක එම ස්ථිර ආයතනය හෝ ස්ථාවර පදනම පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේ දී එම රාජ්‍යභාග උද්ගත වන ලෙස සැළකිය යුතුය.

6. ගෙවන්නා හා අර්ථලාභී හිමිකරු අතර හෝ ඔවුන් දෙදෙනාම සහ වෙනත් යම් තැනැත්තෙකු අතර පවත්නා විශේෂ සම්බන්ධතාවයක් නිසා ගෙවනු ලබන රාජ්‍යභාග ප්‍රමාණය, එවැනි සම්බන්ධතාවයක් නොමැති විට, භාවිතය, අයිතිවාසිකම හෝ තොරතුරු සැලකිල්ලට ගනිමින්, ගෙවන්නා සහ අර්ථලාභී හිමිකරු විසින් එකගවිය හැකිව තිබුණු ප්‍රමාණය ඉක්මවන විට, මෙම වගන්තියේ විධිවිධාන අදල විය යුත්තේ අවසානයට සඳහන් ප්‍රමාණයට පමණි. එවැනි අවස්ථාවක දී ගෙවීම් වල අතිරික්ත කොටස, මෙම ගිවිසුමෙහි අනෙක් විධිවිධානයන් සුදුසු පරිදි සැලකිල්ලට ගනිමින් ඒ ඒ ගිවිසුම්කාර රාජ්‍යයේ නීතියට අනුකූලව තවදුරටත් බද්දට යටත් කළ යුතුය.

13 වැනි වගන්තිය

**ප්‍රාග්ධන ලාභ**

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයකු විසින් 6 වැනි වගන්තියේ සඳහන් වූ සහ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි පිහිටියා වූ නිශ්චල දේපළ අන්සතු කිරීමෙන් ලබන ලැබීම්, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායකට අයත් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ඇති ස්ථිර ආයතනයක ව්‍යාපාර දේපළෙහි කොටසක් වන චංචල දේපළ අන්සතු කිරීමෙන් හෝ ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ස්වාධීන පුද්ගලික සේවා සැපයීම සඳහා එහි ඇති ස්ථාවර පදනමකට අදාළ චංචල දේපළ අන්සතු කිරීමෙන් ලැබෙන ලැබීම්, එම ස්ථිර ආයතනය (එය පමණක් හෝ සම්පූර්ණ ව්‍යවසාය සමඟ) හෝ එකී ස්ථාවර පදනම අන්සතු කිරීමෙන් ලැබෙන ලැබීම් ද ඇතුළුව, එම අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

3. අන්තර්ජාතික ගමනාගමනයෙහි යොදවන ලද නැව් හෝ ගුවන්යානා හෝ එවැනි නැව් හෝ ගුවන්යානා මෙහෙයවීමට අදාළ චංචල දේපළ අන්සතු කිරීමෙන් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් ලබන ලැබීම්, එකී රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතුය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් හවුල් ව්‍යාපාරයක පොලිය වැනි කොටස් හෝ සංසන්දනාත්මක පොලීන් අන්සතු කිරීම මගින් උපයන ලාභ, 6 වැනි වගන්තියේ සඳහන් කර ඇති පරිදි, අන්සතු කිරීමට පෙර දින 365ක කාලපරිච්ඡේදය තුළ ඕනෑම වේලාවක, එම කොටස් හෝ සංසන්දනාත්මක පොලියන් ඒවායේ වටිනාකමින් සියයට 50කට වඩා වැඩියෙන් ඍජුව හෝ වක්‍රව අනෙක් රාජ්‍යයේ පිහිටා ඇති නිශ්චල දේපළක් මගින් උපයන්නේ නම් ඒවා, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේදී බද්දට යටත් කළ හැකිය.

5. 1, 2, 3 සහ 4 වැනි ඡේදවල සඳහන් දේපළ හැර වෙනත් යම් දේපළක් අන්සතු කිරීමෙන් ලැබෙන ලැබීම් එම දේපළ අන්සතු කරන්නා වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතු ය.

### 14 වැනි වගන්තිය

### ස්වාධීන පෞද්ගලික සේවා

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් වෘත්තීය සේවා හෝ ස්වාධීන ආකාරයේ වෙනත් කටයුතු වෙනුවෙන් ලබන ආදායම, ඔහුගේ කටයුතු ඉටු කිරීමේ කාර්යය සඳහා නිරතුරුව පවතින ස්ථිර පදනමක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ඔහුට තිබෙන අවස්ථාවල දී හැර එම රාජ්‍යයේදී පමණක් බද්දට යටත් කළ යුතුය. එවැනි ස්ථිර පදනමක් තිබේ නම් එහි දී එසේ අනෙක් රාජ්‍යයේ දී බදු අය කළ හැකි වන්නේ එම ස්ථිර පදනමට ආරෝපණය කළ හැකි ආදායමට පමණි.

2. ''වෘත්තීය සේවා'' යන පදයට ස්වාධීන, විද්‍යාත්මක, සාහිත්‍යමය, කලාත්මක, අධ්‍යාපනික හෝ ඉගැන්වීමේ ක්‍රියාකාරකම් මෙන්ම වෛද්‍යවරුන්ගේ, නීතිඥයින්ගේ, ඉංජිනේරුවරුන්ගේ, ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ, දන්ත වෛද්‍යවරුන්ගේ සහ ගණකාධිකාරීවරුන්ගේ ස්වාධීන ක්‍රියාකාරකම් ද විශේෂයෙන් ඇතුළත් වේ.

### 15 වැනි වගන්තිය

### පරායත්ත පෞද්ගලික සේවා

1. 16, 18, 19 සහ 20 වන වගන්තිවල විධිවිධානයන්ට යටත් ව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සේවා නියුක්තියක් වෙනුවෙන් ලබන වැටුප්, වේතන සහ එවැනි වෙනත් පාරිශ්‍රමිකයන්, එකී සේවා නියුක්තියෙහි යෙදෙන්නේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි නම් මිස, එම රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් විය යුතුය. එසේ සේවා නියුක්තියෙහි යෙදෙන්නේ නම්, එම සේවා නියුක්තියෙන් ලබන පාරිශ්‍රමික එකී අනෙක් රාජ්‍යයෙහි දී බද්දට යටත් කළ හැකිය.

2. 1 වැනි ඡේදයේ විධිවිධානයන් හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු, විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි යෙදුනු සේවා නියුක්තියක් සම්බන්ධයෙන් ලැබූ පාරිශ්‍රමිකඃ

(අ) එම පාරිශ්‍රමිකය ලබන්නා අදාල මූල්‍ය වර්ෂය තුළ ආරම්භ වන හෝ අවසාන වන යම් දොළොස් මාසයක කාලපරිච්ඡේදයක් තුළ එකතුව දින 183කට නොවැඩි කාලපරිච්ඡේදයක් හෝ කාලපරිච්ඡේදයන් එම අනෙක් රාජ්‍යයෙහි සිටින්නේ නම්; සහ

(ආ) එම පාරිශ්‍රමිකය, එකී අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු නොවන සේවායෝජකයෙකු විසින් හෝ වෙනුවෙන් ගෙවනු ලබන්නේ නම්; සහ

(ඇ) එම පාරිශ්‍රමිකය, සේවා යෝජකයාට එකී අනෙක් රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයකින් හෝ ස්ථාවර පදනමකින් දරනු නොලබන්නේ නම්,

එකී පළමුව සඳහන් කළ රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් විය යුතුය.

3. මෙම වගන්තියේ පූර්ව විධිවිධානයන් හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් ජාත්‍යන්තර ගමනාගමනයෙහි ලා මෙහෙයවනු ලබන නැවක් හෝ ගුවන් යානයක් තුළ කරනු ලබන සේවා නියුක්තියක් සම්බන්ධයෙන් ලබන පාරිශ්‍රමිකය, එම ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් විය යුතුය.

**16 වැනි වගන්තිය**

**අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු**

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන, සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ සමාගමක ඒ හා සමාන ව්‍යුහයක අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තු හා වෙනත් ඊට සමාන ගෙවීම්, එම අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසික වන සමාගමක ඉහළ මට්ටමේ කළමනාකරණ නිලධාරියෙකු ලෙස උපයන වැටුප්, වේතන සහ වෙනත් ඊට සමාන පාරිශ්‍රමික එම අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

**17 වැනි වගන්තිය**

**විනෝදය සපයන්නන් සහ ක්‍රීඩකයන්**

1. 14 වැනි සහ 15 වැනි වගන්තිවල විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු නාට්‍ය, චලන චිත්‍රපට, ගුවන් විදුලි හෝ රූපවාහිනී කලා ශිල්පියෙකු හෝ සංගීතඥයෙකු වැනි විනෝදය සපයන්නෙකු හෝ ක්‍රීඩකයෙකු වශයෙන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී එකී වාසිකයාගේ පුද්ගලික ක්‍රියාකාරකම්හි නිරතවීමෙන් ලබන ආදායම, එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

2. විනෝදය සපයන්නෙකු හෝ ක්‍රීඩකයෙකු වශයෙන් ඔහුගේ එම පුද්ගලික ක්‍රියාකාරකම්හි නිරතවීම සම්බන්ධයෙන් වන ආදායම, එම විනෝද සපයන්නාටම හෝ ක්‍රීඩකයාටම නොව, වෙනත් තැනැත්තෙකුට උපචිත වන අවස්ථාවක දී, 14 වැනි සහ 15 වැනි වගන්තිවල කුමක් සඳහන් වූවද, විනෝදය සපයන්නාගේ හෝ ක්‍රීඩකයාගේ කටයුතු ක්‍රියාත්මක වන ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

3. 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධානයන්හි කුමක් සඳහන් වුවද, 1 වැනි ඡේදයේ සඳහන් වන ක්‍රියාකාරකම්වලින් ලබන ආදායම, එම ක්‍රියාකාරකම ගිවිසුම්කාර රාජ්‍යයන් දෙක අතර වන සංස්කෘතික ගිවිසුම් හෝ වැඩපිළිවෙලක් යටතේ සිදු වුවක් වන විට, එම රාජ්‍යයේ සංචාරය සඳහා ආධාර පූර්ණ හෝ ප්‍රමාණවත් වශයෙන් ගිවිසුම්කාර රාජ්‍යයන් අතරින් එකක් හෝ එහි පළාත් පාලන ආයතනයක් හෝ මහජන ආයතනයක අරමුදල් මගින් ලබාදී ඇත්තේ නම්, එම ක්‍රියාකාරකම් සිදු වූ ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

**18 වැනි වගන්තිය**

**විශ්‍රාම වැටුප්**

19 වැනි වගන්තියේ 2 වන ඡේදයේ විධිවිධානයන්ට යටත් ව, එක් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුට අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ අතීත සේවා නියුක්තියට හෝ සේවයට ප්‍රතිෂ්ඨාවක් වශයෙන් එකී අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි ප්‍රභවකින් ගෙවනු ලබන විශ්‍රාම වැටුපක් හෝ ඊට සමාන පාරිශ්‍රමිකයන් සහ වාර්ෂිකයක් එකී අනෙක් රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකිය.

**19 වැනි වගන්තිය**

**ආණ්ඩුවේ සේවය**

1. ආ) ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එහි දේශපාලනික උප කොට්ඨාසයක් හෝ ප්‍රාදේශීය අධිකාරියක් විසින් එම රාජ්‍යය හෝ අධිකාරිය වෙත ඉටු කරන ලද සේවාවක් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන වැටුප්, වේතන සහ වෙනත් සමාන පාරිශ්‍රමික එම රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

ආ) කෙසේ වූවද, එම සේවාවන් ඉටු කරන ලද්දේ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී නම් සහ එකී පුද්ගලයා එම අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු වන්නේ නම්, ඔහු ඃ

(i) එම රාජ්‍යයේ ජාතිකයෙකු වේ නම්; හෝ
(ii) හුදෙක් එම සේවාව ඉටු කිරීමේ කාර්යය සඳහාම පමණක් එම රාජ්‍යයේ වාසිකයෙකු බවට පත් නොවූ තැනැත්තෙකු නම්;

එවැනි වැටුප්, වේතන හා වෙනත් සමාන පාරිශ්‍රමිකයන් එම ගිවිසුම්කාර රාජ්‍යයෙහි දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

2. අ) 1 වන ඡේදයේ කුමක් සඳහන් වුව ද, ගිවිසුම්කාර රාජ්‍යයක්, හෝ එහි දේශපාලනික උප කොට්ඨාසයක් හෝ ප්‍රාදේශීය අධිකාරියක් විසින් හෝ ඒවායින් ඇති කරන ලද අරමුදල්වලින් එම රාජ්‍යය, හෝ උප කොට්ඨාසය හෝ අධිකාරිය වෙත ඉටු කරන ලද සේවාවන් වෙනුවෙන් යම් පුද්ගලයෙකු වෙත ගෙවනු ලබන යම් විශ්‍රාම වැටුපක් එකී රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතුය.

ආ) කෙසේ වුවද, එම පුද්ගලයා එකී අනෙක් රාජ්‍යයේ වාසිකයෙකු සහ ජාතිකයෙකු වන්නේ නම් එවැනි විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ඊට සමාන පාරිශ්‍රමික අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී පමණක් බද්දට යටත් කළ යුතු ය.

3. ගිවිසුම්කාර රාජ්‍යයක් හෝ එවැනි දේශපාලනික උප කොට්ඨාසයක් හෝ පළාත් පාලන අධිකාරියක් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඉටු කරන ලද සේවාවන්ට අදාළ වන වැටුප්, වේතන, විශ්‍රාම වැටුප් සහ වෙනත් පාරිශ්‍රමිකයන්ට 15, 16, 17 සහ 18 වැනි වගන්තිවල විධිවිධාන අදාළ විය යුතු ය.

### 20 වැනි වගන්තිය

### ශිෂ්‍යයන් සහ ගුරුවරුන්

1. ගිවිසුම්කාර රාජ්‍යයකට පැමිණීමට පූර්වාසන්නයෙහි අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයෙහි වාසිකයෙකු වූ හෝ වාසිකයෙකු වන, ස්වකීය අධ්‍යාපනය හෝ පුහුණුව යන කාර්යයන් සඳහා පමණක්ම පළමුව සඳහන් ගිවිසුම්කාර රාජ්‍යයෙහි සිටින ශිෂ්‍යයෙකු, ආධුනිකයෙකු හෝ ව්‍යාපාරික අභ්‍යාසලාභියෙකු ස්වකීය නඩත්තුව, අධ්‍යාපනය හෝ පුහුණුව සම්බන්ධ කාර්යයන් සඳහා ලබන ගෙවීම්, එම රාජ්‍යයෙන් පරිබාහිර ප්‍රභවයන්ගෙන් උද්ගත වන ගෙවීම් වන්නේ නම්, එම පළමුව සඳහන් රාජ්‍යයේ දී බද්දට යටත් නොකළ යුතුය.

2. එසේම, අනෙක් සාමාජික රාජ්‍යයට පැමිණීමට පූර්වාසන්නයෙහි සාමාජික ගිවිසුම්කාර රාජ්‍යයන්ගෙන් එකක වාසිකයෙකු වන හෝ පුද්ගලික සේවා සඳහා දෙවර්ෂයක් නොඉක්මවන කාලසීමාවක් හෝ කාලසීමා සඳහා ඉගැන්වීම හෝ විද්‍යාත්මක පර්යේෂණවල නියැලීම මූලික කාර්යය කොටගත් ඉගැන්වීම හෝ පර්යේෂණ සම්බන්ධයෙන් මහාචාර්යවරයෙකු, පර්යේෂණ විද්වතෙකු ගුරුවරයෙකු හෝ උපදේශකවරයෙකු ලබන පාරිශ්‍රමිකය එකී ගෙවීම පළමුව සඳහන් කළ රාජ්‍යයට පරිබාහිර ප්‍රභවයකින් උද්ගත වන අවස්ථාවක දී පළමුව කී රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් විය යුතු ය.

3. මූලික වශයෙන් නිශ්චිත තැනැත්තෙකුගේ හෝ තැනැත්තන්ගේ පෞද්ගලික ප්‍රතිලාභ සඳහා පර්යේෂණ කරන්නේ නම් එවැනි පර්යේෂණ කිරීම වෙනුවෙන් මහාචාර්යවරයෙකු, පර්යේෂණ විද්වතෙකු, ගුරුවරයෙකු හෝ උපදේශකවරයෙකු ලබන පාරිශ්‍රමිකය සඳහා මෙම වගන්තියේ 2 වන ඡේදය අදාළ නොවිය යුතු ය.

### 21 වැනි වගන්තිය

### වෙනත් ආදායම්

1. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකුගේ මෙම ගිවිසුමෙහි පූර්ව වගන්තිවල සඳහන් නොවන ආදායම් අයිතමයන් කොතැනක උද්ගත වුව ද, එම ගිවිසුම්කාර රාජ්‍යයේදී පමණක් බද්දට යටත් විය යුතු ය.

2. ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් මගින් එකී අනෙක් රාජ්‍යයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි නම් හෝ එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථාවර පදනමක් මගින් එම අනෙක් රාජ්‍යයේ ස්වාධීන පුද්ගලික සේවාවක් ඉටු කරයි නම් සහ ආදායම ගෙවනු ලබන අයිතිවාසිකම් හෝ දේපළ ඉහත සඳහන් ආයතනයට හෝ ස්ථාවර පදනමට ක්‍රියාකාරී ලෙස සම්බන්ධ වී ඇත්නම්, 6 වන වගන්තියේ දෙවන ඡේදයේ අර්ථ දක්වා ඇති පරිදි නිශ්චල දේපළ වලින් ලැබෙන ආදායම හැර අනෙකුත් ආදායම්වලට මෙම වගන්තියේ පළමු ඡේදයේ විධිවිධාන අදාළ නොවිය යුතුය. එබඳු අවස්ථාවන්හි දී 7 වන වගන්තියේ හෝ 14 වැනි වගන්තියේ විධිවිධාන අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතු ය.

### 22 වැනි වගන්තිය

### ද්විත්ව බදුකරණය ඉවත් කිරීම

1. මෙම ගිවිසුමෙහි විධිවිධාන හා අනුකූලව, ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු ආදායම උපයන කල්හි, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී බද්දට යටත් කළ හැකි අතර (ආදායම තනිකරම එකී රාජ්‍යයේ වාසිකයෙකු විසින් උපයන ආදායමක් වන නිසා, එකී අනෙක් රාජ්‍යය විසින් මෙම විධිවිධානයන් මගින් බදුකරණයට ඉඩදෙන ප්‍රමාණයට හැර), පළමුව සඳහන් කළ රාජ්‍යය, එකී වාසිකයාගේ ආදායම මත බද්දෙන් එකී අනෙක් රාජ්‍යයේ දී ගෙවූ ආදායම් බදු ප්‍රමාණයට සමාන ප්‍රමාණයකින් අඩු කිරීමට ඉඩ ලබාදිය යුතුය.

කෙසේ වුවද, කවර අවස්ථාවක දී හෝ අඩුකිරීමක් ලබාදීමට පෙර ගණනය කරන ලද පරිදි ආදායම් බද්දේ එකී කොටස එම අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ බදු අය කළ හැකි ආදායමට ආරෝපණය කළ හැකි බද්ද නොඉක්මවිය යුතුය.

2. මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු විසින් උපයනු ලබන ආදායම එකී රාජ්‍යයේ දී බද්දෙන් නිදහස් වනවිට, එතෙකුදු වුවත් එම රාජ්‍ය විසින් එම වාසිකයාගේ ඉතිරි ආදායම මත බදු මුදල ගණනය කිරීමේ දී එසේ නිදහස් කරනු ලැබූ ආදායම සැලකිල්ලට ගනු ලබිය හැකි ය.

### 23 වැනි වගන්තිය

### වෙනස් ලෙස නොසැළකීම

1. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ජාතිකයන් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ දී, විශේෂයෙන් වාසික භාවය සලකා, එම අනෙක් රාජ්‍යයේ ඒ හා සමාන තත්ත්වයේ සිටින ජාතිකයන්ට වඩා වෙනස් වූ හෝ දැරීමට වඩාත් දුෂ්කර වූ යම් බදු අය කිරීමකට හෝ ඒ හා සම්බන්ධ යම් අවශ්‍යතාවයකට යටත් කරනු නොලැබිය යුතු ය.

2. එක් ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් සතු අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ ඇති ස්ථිර ආයතනයක් මත එම කටයුතු වලම නියැලෙන එම අනෙක් රාජ්‍යයේ ව්‍යවසායන් සම්බන්ධයෙන් බදුකරණයට වඩා අඩු වාසි සැලසෙන පරිදි එකී අනෙක් රාජ්‍යයේ දී බදු අය නොකළ යුතු ය.

3. 9 වන වගන්තියේ 1 වන ඡේදයේ, 11 වන වගන්තියේ 7 වන ඡේදයේ හෝ 12 වන වගන්තියේ 6 වන ඡේදයේ විධිවිධාන බලපවත්නා අවස්ථාවල දී හැර, ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායක් විසින් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලබන පොළී, රාජ්‍යභාග සහ අනෙකුත් වියදම් එවැනි ව්‍යවසායක බදු අය කළ හැකි ලාභ නිර්ණය කිරීමේ කාර්යය සඳහා පළමුව සඳහන් රාජ්‍යයේ වාසිකයෙකුට ගෙවනු ලැබූ ආකාරයටම එම කොන්දේසි යටතේම අඩු කළ යුතු ය.

4. ගිවිසුම්කාර රාජ්‍යයක ව්‍යවසායන් හි ප්‍රාග්ධනය සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසක් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයෙකු හෝ වාසිකයන් වැඩි දෙනෙකු විසින් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් අයිතිව හෝ පාලනය කරනු ලබන කල්හි, එකී පළමුව සඳහන් රාජ්‍යයේ එබඳු වෙනත් ව්‍යවසායන් යටත් වන හෝ යටත් කළ හැකි වන බදුවලට හෝ ඒ හා සම්බන්ධ වෙනත් අවශ්‍යතාවයන්ට වඩා වෙනස් වූ හෝ දුෂ්කර වූ කිසිදු බද්දකට එකී පළමුව සඳහන් රාජ්‍යයෙහි දී යටත් කරනු නොලැබිය යුතු ය.

5. මෙම විධිවිධාන යම් ගිවිසුම්කාර රාජ්‍යයක් තමන්ගේම වාසිකයන්ට ලබාදෙන යම් පුද්ගලික දීමනා, සහන සහ වෛවාසික තත්ත්වය හෝ පවුල් වගකීම් මත බදු කාර්යයන් සඳහා වන අඩුකිරීම් අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ වාසිකයන්ට ප්‍රදානය කිරීමට ඉඩ සලසන ලෙස සැකසීම නොකළ යුතු ය.

6. 2 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද මෙම වගන්තියේ විධිවිධාන සෑම ආකාරයකම සහ විස්තරයකම බදු වලට අදාළ වේ.

### 24 වැනි වගන්තිය

### අන්‍යෝන්‍ය එකඟත්ව ක්‍රියා පිළිවෙළ

1. ගිවිසුම්කාර රාජ්‍යයන් දෙකෙන් එකක හෝ දෙකෙහිම ක්‍රියාවන් හි ප්‍රතිඵලයක් වශයෙන් මෙම ගිවිසුමේ විධිවිධානයන්ට අනුකූල නොවන අයුරින් තමා බදුකරණයට පාත්‍රවන්නේ යයි හෝ එසේ පාත්‍ර වී ඇතැයි යම් ගිවිසුම්කාර රාජ්‍යයක වාසිකයෙකු සලකන අවස්ථාවක, එකී රාජ්‍යයන්හි දේශීය නීති මගින් සලසා ඇති ප්‍රතිකර්මයන් නොසලකා, ඔහු වාසිකයෙකු වන ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා වෙත හෝ ඔහුගේ සිද්ධිය 23 වැනි වගන්තියේ 1 වැනි ඡේදය යටතට පත්වේ නම්, ඔහු ජාතිකයෙකු වන රාජ්‍යයේ නිසි බලධරයා වෙත කරුණු ඉදිරිපත් කිරීමට ඔහුට හැකිය. මෙම ගිවිසුමේ විධිවිධානවලට අනුකූල නොවන බදුකරණය උද්ගතවීමට හේතුවන ක්‍රියාව පිළිබඳ ප්‍රථම දැන්වීමෙන් පසුව වර්ෂ තුනක් ඇතුළත එකී කරුණු ඉදිරිපත් කිරීම කළ යුතු ය.

2. විරෝධතාවය යුක්ති සහගත යයි නිසි බලධරයාට පෙනී යන්නේ නම් සහ තනිව යෝග්‍ය විසඳුමක් කරා එළඹීමට ඔහු අපොහොසත් වන්නේ නම්, මෙම ගිවිසුමට අනුකූල නොවන බදුකරණය වළක්වාලීමේ අදහසින්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නිසි බලධරයා සමග අන්‍යෝන්‍ය එකඟත්වයෙන් තත්ත්වය නිරාකරණය කර ගැනීමට ඔහු උත්සහ කළ යුතුය. එළඹෙන ලද යම් එකඟතාවයක් ගිවිසුම්කාර රාජ්‍යයන්හි දේශීය නීතින් යටතේ පවතින කාලය පිළිබඳ යම් සීමා කිරීම් වලට යටත් නොකර ක්‍රියාත්මක කළ යුතු ය.

3. මෙම ගිවිසුම අර්ථ නිරූපණය කිරීම හෝ අදාළ කිරීම සම්බන්ධයෙන්, යම් දුෂ්කරතාවයක් හෝ සැකයක් පවතී නම් ඒවා ගිවිසුම්කාර රාජ්‍යයන්හි නිසි බලධරයන්ගේ අන්‍යෝන්‍ය එකඟත්වයෙන් නිරාකරණය කර ගැනීමට උත්සාහ කළ යුතු ය. මෙම ගිවිසුමෙහි විධිවිධාන සලසා නොමැති අවස්ථාවන්හිදී ද, ද්විත්ව බදුකරණය ඉවත් කිරීම සඳහා ඔවුන් සාමූහිකව සාකච්ඡා කළ යුතු ය.

4. පෙර ඡේදවල අර්ථානුකූලව එකඟතාවයකට එළඹීමේ කාර්යය සඳහා ගිවිසුම්කාර රාජ්‍යවල නිසි බලධාරීන්ට සෘජුවම, ඔවුන් අන්තර්ගත වන සාමූහික කොමිසමක් හෝ ඔවුන්ගේ නියෝජිතයන් අතර අදහස් හුවමාරු කරගත හැකි ය.

## 25 වැනි වගන්තිය

### තොරතුරු හුවමාරු කරගැනීම

1. මෙම ගිවිසුමෙහි විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සඳහා; හෝ ගිවිසුම්කාර රාජ්‍යයන්, එහි දේශපාලන උප කොට්ඨාස හෝ පළාත් පාලන ආයතන වෙනුවෙන් පනවන ලද ඕනෑම වර්ගයකට හෝ විස්තරයකට අයත් දේශීය නීතින්, එහි දැක්වෙන බදුකරණය මෙම ගිවිසුමට ප්‍රතිවිරුද්ධ නොවනතාක් දුරට, පරිපාලනය හෝ බලාත්මක කිරීම සඳහා අදාළ වන්නේ යැයි පූර්ව නිගමනයකට එළඹිය හැකි වන්නාවූ තොරතුරු ගිවිසුම්කාර රාජ්‍යයන්ගේ නිසි බලධරයන් විසින් හුවමාරු කරගත යුතු ය. තොරතුරු හුවමාරු කරගැනීම 1 වැනි සහ 2 වැනි වගන්තිවලින් සීමා නොවේ.

2. 1 වන ඡේදය යටතේ ගිවිසුම්කාර රාජ්‍යයකට ලැබෙන යම් තොරතුරක්, එම රාජ්‍යයේ දේශීය නීති යටතේ ලබාගත් තොරතුරු රහස්‍ය සේ සලකන පරිද්දෙන්ම සැළකිය යුතු අතර, 1 වන ඡේදයේ සඳහන් බදු වලට අදාළ තක්සේරු කිරීම හෝ අය කිරීම, ඒ සම්බන්ධයෙන් බලාත්මක කිරීම හෝ නඩු පැවරීම, එම බදු සම්බන්ධ අභියාචනා තීරණය කිරීම හෝ ඒවාට අදාළ යම් මග හැරීමක් එම කාරණය හා සම්බන්ධ වූ තැනැත්තන්ට හා බලධරයන්ට (උසාවි හා පරිපාලන මණ්ඩල ද ඇතුළුව) පමණක් හෙළි කළ යුතු ය. එවැනි තැනැත්තන්ට හා බලධරයන්ට එවැනි කටයුතු සඳහා පමණක් මෙම තොරතුරු භාවිතා කළ හැකිය. ඔවුන්ට ප්‍රසිද්ධ උසාවි කටයුතුවලදී හෝ අධිකරණ තීන්දුවල දී එම තොරතුරු හෙළි කළ හැකිය. ඉහත කුමක් සඳහන් වුවද, ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් ලබාගන්නා තොරතුරු, වෙනත් කාර්යයන් සඳහා යොදාගැනීමට රාජ්‍යයන් දෙකෙහිම නීතීන් යටතේ හැකි විටකදී. සහ තොරතුරු ලබාදෙන රාජ්‍යයේ නිසි බලධාරියා විසින් එලෙස යොදා ගැනීමක් අනුමත කරන්නේ නම්, එකී වෙනත් කාර්යයන් සඳහා යොදාගත හැක.

3. 1 වැනි සහ 2 වැනි ඡේදයන්හි විධිවිධාන මගින් ගිවිසුම්කාර රාජ්‍යයක් මත :

(අ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති සහ පරිපාලනමය භාවිතයන් වලින් වෙනස් ආකාරයට පරිපාලනමය විධිවිධාන ක්‍රියාත්මක කිරීම;

(ආ) එම ගිවිසුම්කාර රාජ්‍යයේ හෝ අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ නීති යටතේ හෝ සාමාන්‍ය පරිපාලනමය ක්‍රියාවලියේදී ලබාගත නොහැකි තොරතුරු සැපයීම;

(ඇ)යම් වෙළඳ, ව්‍යාපාරික, කාර්මික, වාණිජ හෝ වෘත්තීය රහසක් හෝ වෙළඳ ක්‍රියාවලියක් හෝ තොරතුරක් හෙළිදරව් කරන තොරතුරක් හෝ හෙළිදරව් කිරීම රජයේ ප්‍රතිපත්තියට පටහැනි වන යම් තොරතුරක් (Ordre public) සැපයීම;

යනාදී බැඳීම් පැනවෙන්නේ යයි කිසිදු අවස්ථාවක දී තේරුම් නොගත යුතුය.

4. මෙම වගන්තියට අනුකූලව යම් ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් තොරතුරු අපේක්ෂා කරන්නේ නම්, අනෙක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් තම බදු පරමාර්ථයන් සඳහා එවැනි තොරතුරු අවශ්‍ය නොවන්නේ වුවද, අපේක්ෂිත තොරතුරු ලබාගැනීම පිණිස තම තොරතුරු රැස්කිරීමේ ක්‍රියා මාර්ග භාවිතා කළ යුතුය. පූර්ව වාක්‍යයෙහි වූ බැඳීම 3 වන ඡේදයේ සඳහන් සීමාවන්ට යටත් වන නමුත් කිසිදු අවස්ථාවක දී එකී සීමාවන් මගින් ගිවිසුම්කාර රාජ්‍යයක්, හුදෙක් එවැනි තොරතුරු සම්බන්ධයෙන් දේශීය වශයෙන් උනන්දුවක් නැති නිසාම එම තොරතුරු සපයාදීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩදීමක් ලෙස තේරුම් නොගත යුතුය.

5. තොරතුරු, හුදෙක් බැංකුවක්, වෙනත් මූල්‍යායතනයක්, නියෝජිත ආයතනයක් වෙනුවෙන් හෝ පීත කොමිසමක භාරකරු වශයෙන් නාමිකයෙකු හෝ තැනැත්තෙකු භාරයේ පැවතීම හේතුවෙන්ම හෝ එය තැනැත්තෙකුගේ අයිතිය පිළිබඳ හිමිකම්වලට සම්බන්ධ වූවක් නිසාම එම තොරතුරු සපයාදීම ප්‍රතික්ෂේප කිරීමට ඉඩදීමක් ලෙස 3 වන ඡේදයේ සඳහන් විධිවිධාන වටහා නොගත යුතුය.

## 26 වැනි වගන්තිය

### රාජ්‍ය තාන්ත්‍රික දූත සේවා හෝ කොන්සල් තනතුරු දරන සාමාජිකයින්

ජාත්‍යන්තර නීතියේ පොදු නීති රීති යටතේ හෝ විශේෂ ගිවිසුම්වල විධිවිධාන යටතේ රාජ්‍ය තාන්ත්‍රික දූත සේවා හෝ කොන්සල් තනතුරු දරන සාමාජිකයින්ගේ මූල්‍ය වරප්‍රසාද කෙරෙහි මෙම ගිවිසුමේ කිසිවක් බලනොපෑ යුතුය.

27 වැනි වගන්තිය

**ප්‍රතිලාභ සඳහා හිමිකම**

මෙම ගිවිසුමේ අනෙකුත් විධිවිධානවල කුමක් සඳහන් වුවද මෙම ගිවිසුම යටතේ අදාළ අයිතමයක් මත වන ප්‍රතිලාභ, එකී ප්‍රතිලාභය ලබාගැනීම, ඕනෑම සැකැස්මකින් හෝ ගනුදෙනුවකින් අපේක්ෂා කර ප්‍රධාන කාර්යයන්ගෙන් එකක් හෝ එකී ප්‍රතිලාභය මගින් ඍජුව හෝ වක්‍රව ලැබෙන්නේ නම් ද, මෙම වාතාවරණයන් මත එම ප්‍රතිලාභය ප්‍රදානය කිරීම මෙම ගිවිසුමේ අදාළ විධිවිධානයන්හි අභිමතාර්ථ සහ කාර්යයන් සමඟ අනුකූල වන්නේ යැයි ස්ථාපනය කර ඇත්නම්, අදාළ සියළු කරුණු සහ වාතාවරණයන් සැළකිල්ලට ගෙන එලෙස නියම කිරීම සාධාරණ වන්නේ නම් පමණක් මිස මෙම ගිවිසුම යටතේ ප්‍රතිලාභයන් ප්‍රදානය නොකළ යුතුය.

28 වැනි වගන්තිය

**බලාත්මකවීම ආරම්භවීම සහ සංශෝධනය**

1. එක් එක් ගිවිසුම්කාර රාජ්‍යය විසින් රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා මෙම ගිවිසුම බලාත්මක වීමට අවශ්‍ය අභ්‍යන්තර නෛතික ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇති බව දක්වෙන අවසාන ලිඛිත දැන්වීම ලැබුණු දින සිට මෙම ගිවිසුම බලාත්මක විය යුතුය.

2. මෙම ගිවිසුමේ විධිවිධාන ඃ

(අ) තුර්කියේ දී,

(i) ප්‍රභවයේදී රඳවා ගත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වන දිනයට පසුව එළඹෙන ජනවාරි මස පළමු වැනි දින හෝ ඉන්පසුව ගෙවිය යුතු හෝ බැර විය යුතු මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන්; සහ

(ii) වෙනත් ආදායම් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වන දිනයට පසුව එළඹෙන ජනවාරි මස පළමු වැනි දින හෝ ඉන්පසුව ආරම්භ වන ආදායම් වර්ෂ සම්බන්ධයෙන්,

බලපැවැත්විය යුතුය.

(ආ) ශ්‍රී ලංකාවේ දී,

(i) ප්‍රභවයේදී රඳවා ගත් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක වන දිනයට පසුව එළඹෙන පළමු ලිත් වර්ෂයේ අප්‍රේල් මස පළමු වැනි දින හෝ ඉන්පසුව ගෙවිය යුතු හෝ බැරවිය යුතු මුදල් ප්‍රමාණයන් සම්බන්ධයෙන්,

(ii) ආදායම් බදු සම්බන්ධයෙන්, ගිවිසුම බලාත්මක දිනයට පසුව එළඹෙන පළමු ලිත් වර්ෂයේ අප්‍රේල් මස පළමු වැනි දින හෝ ඉන්පසුව ආරම්භ වන ආදායම් වර්ෂ සම්බන්ධයෙන්,

බලපැවැත්විය යුතුය.

3. ගිවිසුම්කාර රාජ්‍යයන්වල අන්‍යෝන්‍ය ලිඛිත කැමැත්ත මත ඕනෑම අවස්ථාවකදී මෙම ගිවිසුම සංශෝධනය කළ හැක. මෙම වගන්තියේ පළමු ඡේදය යටතේ විස්තර කර ඇති නෛතික පරිපාටියට අනුකූලව සංශෝධන බලාත්මක විය යුතුය.

29 වැනි වගන්තිය

**අවසන් කිරීම**

1. ගිවිසුම්කාර රාජ්‍යයක් විසින් අවසන් කරනු ලබන තෙක් මෙම ගිවිසුම බලපැවැත්විය යුතුය. ගිවිසුම බලාත්මක වන දිනයේ සිට වසර පහක කාල පරිච්ඡේදයකින් පසුව එළඹෙන ඕනෑම ලිත් වර්ෂයක් අවසන්වීමට අවම වශයෙන් මාස හයකට පෙර රාජ්‍ය තාන්ත්‍රික මාර්ග හරහා අවසන් කිරීම පිළිබඳ ලිඛිත නිවේදනයක් මගින් කවර හෝ ගිවිසුම්කාර රාජ්‍යයකට මෙම ගිවිසුම අවසන් කළ හැකිය.

2. එවැනි අවස්ථාවකදී ඃ

(අ) තුර්කියේ දී,

(i) ප්‍රභවයේදී රඳවා ගත් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදුන් ලිත් වර්ෂය අවසාන වීමෙන් පසුව ගෙවූ හෝ බැර කළ ප්‍රමාණ සම්බන්ධයෙන්; සහ

(ii) අනෙක් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදුන් ලිත් වර්ෂය අවසාන වීමෙන් පසුව ආරම්භ වන ආදායම් වර්ෂ සම්බන්ධයෙන්;

(ආ) ශ්‍රී ලංකාවේ දී,

(i) ප්‍රභවයේදී රඳවා ගත් බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදුන් පසුව ඉක්බිතිව එළඹෙන ලිත් වර්ෂයේ අප්‍රේල් මස පළමු වැනි දින හෝ ඉන්පසුව ගෙවිය යුතු හෝ බැර විය යුතු ප්‍රමාණ මත; සහ

(ii) ආදායම මත බදු සම්බන්ධයෙන් වන විට නිවේදනය ලබාදුන් පසු ඉක්බිතිව එළඹෙන ලිත් වර්ෂයේ අප්‍රේල් මස පළමු දින හෝ ඉන්පසුව ආරම්භ වන ඕනෑම ආදායම් වර්ෂයක් සඳහා,

මෙම ගිවිසුම බලපැවැත්වීම නතර විය යුතුය.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය පවරනු ලැබූ මෙහි පහත සඳහන් කරන අය මෙම ගිවිසුමට අත්සන් තබන ලදී.

එක හා සමාන බල සහිත පාඨයන්ගෙන් යුක්ත සිංහල, තුර්කි සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මුල් පිටපත් දෙකකින් යුතුව වර්ෂ 2022 ජනවාරි මස 28 දින කොළඹ දී අත්සන් තබන ලදී. අර්ථ නිරූපනයේ දී ප්‍රතිවිරුද්ධතාවක් ඇති වුවහොත් ඉංග්‍රීසි පාඨය බලපැවැත්විය යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී,
ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්,
මහාචාර්ය ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
විදේශ අමාත්‍ය.

තුර්කි ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්,
මෙව්ලුට් චව්ෂෝව්ලු,
විදේශ කටයුතු අමාත්‍ය.

**සංධාන පත්‍රය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුව සහ තුර්කි ජනරජ ආණ්ඩුව අතර ආදායම් මත වූ බදු සහ බදු නොගෙවීම හා පැහැරහැරීම වැළැක්වීම සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සඳහා ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේ දී අත්සන්කරුවන්, පහත සඳහන් විධිවිධාන මෙම ගිවිසුමේ සංඝටනීය කොටසක් විය යුතු බවට එකඟ වී ඇත.

1. මෙහි 5 වන වගන්තියේ 3 වන ඡේදයේ (අ) උපඡේදය සම්බන්ධයෙන් මෙම ගිවිසුම අත්සන් තබන ලද දිනයට පසුව ශ්‍රී ලංකාව විසින් තුන්වන රාජ්‍යයක් සමග අත්සන් කරන ලද වෙනත් යම් එකඟතාවක්, ගිවිසුමක් හෝ සංධාන පත්‍රයකට අනුකූලව මෙම ගිවිසුමේ 5 වන වගන්තියේ 3 වන ඡේදයේ (අ) උපඡේදයට සබැඳෙන විධිවිධාන සැලකීමේ දී මෙම ඡේදයේ සපයා ඇති කාලපරිච්ඡේදයට වඩා දීර්ඝ වන අවස්ථාවක දී 5 වන වගන්තියේ 3 වන ඡේදයේ (අ) උපඡේදයේ කාර්යයන් සඳහා එවැනි වෙනත් එකඟතාවයන්, ගිවිසුම් හෝ සංධාන පත්‍රයන් බලාත්මක වීම යටතේ දිගු කාලපරිච්ඡේදය ක්‍රියාත්මක වන දිනයේ සිට දිගු කාලපරිච්ඡේදය අදල කරගත යුතුය.

2. 8 වන වගන්තියේ 1 වන ඡේදය සම්බන්ධයෙන් මෙම ගිවිසුම අත්සන් තැබූ දිනෙන් පසුව ශ්‍රී ලංකාව තුන්වන රාජ්‍යයක් සමග එකඟතාවක්, ගිවිසුමක් හෝ සංධාන පත්‍රයක් සඳහා අත්සන් තැබීමට සිදුවුණි නම්, මෙම ගිවිසුමේ සපයා ඇති නාවික ආදායම් බදුකරණය කිරීමට වඩා කරදරකාරී බැවින් අඩු වන අන්තර්ජාතික ගමනාගමනයේ නැව් මෙහෙයවීම මගින් එකී තුන්වන රාජ්‍යයේ ව්‍යවසායක් විසින් උපයන නාවික ආදායම් බදුකරණය කිරීමේ දී නාවික ආදායම් සැලකීමේ දී එකී එකඟතාවයේ, ගිවිසුමේ හෝ සංධානපත්‍රයේ විධිවිධාන හා අනුකූලව මෙම ගිවිසුමේ 8 වන වගන්තියේ විධිවිධාන අදල කරගත යුතු බව අවබෝධ වේ.

3. 10 වන වගන්තියේ 3 වන ඡේදයට අදලව,

(අ) තුර්කිය සම්බන්ධයෙන් ''ලාභාංශ'' යන පදයෙන් තුර්කියේ ආයෝජන අරමුදලකින් හෝ ආයෝජන භාරයකින් උපයන ලද ආදායම ද ඇතුළත් විය යුතු බව අවබෝධ වේ.

(ආ) ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ කළ ආයෝජන අරමුදලකින් හෝ ආයෝජන භාරයකින් උපයන ලද ආදායම් එහි දේශීය නීති විධිවිධාන ප්‍රකාරව, ලාභාංශ හෝ ව්‍යාපාර ප්‍රතිලාභ ලෙස සැලකිය යුතුය.

4. මෙම ගිවිසුමේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වුවද අනෙක් ගිවිසුම්කාර රාජ්‍යයේ පිහිටි ස්ථිර ආයතනයක් හරහා ව්‍යාපාරයක් පවත්වාගෙන යන වාසිකයෙකුගේ සමාගමක ලාභය සම්බන්ධයෙන් 7 වන වගන්තිය යටතේ බදු අය කිරීමෙන් පසු, ස්ථිර ආයතනය පිහිටි ගිවිසුම්කාර රාජ්‍යයේදී සහ එකී රාජ්‍යයේ නීතීන්ට අනුකූලව ඉතිරි ප්‍රමාණය මත බදු අය කළ යුතු අතර එසේ අය කරන බද්ද සියයට 7.5ක අනුප්‍රමාණය නොඉක්මවිය යුතුය. මෙම ඡේදය මෙම ගිවිසුමේ 27 වන වගන්තිය ඉක්මවා නොයා යුතුය.

5. 24 වන වගන්තියේ 2වන ඡේදයට අදාලව යොමුව අවස්ථානුකූලව පොළිය සහ පරිපාලන දණ්ඩන සම්බන්ධයෙන් දේශීය නීති විධිවිධාන අදාල කර ගැනීමටද නිසි බලධාරීන් එකඟවිය යුතු බව අවබෝධ වේ.

මීට සාක්ෂි වශයෙන් විධිමත් පරිදි බලය පවරනු ලැබූ මෙහි පහත සඳහන් කරන අය මෙම සංධාන පත්‍රයට අත්සන් තබන ලදී.

එක හා සමාන බල සහිත පාඨයන්ගෙන් යුක්ත සිංහල, තුර්කි සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් මුල් පිටපත් දෙකකින් යුතුව වර්ෂ 2022 ජනවාරි මස 28 දින කොළඹ දී අත්සන් තබන ලදී. අර්ථ නිරූපනයේ දී ප්‍රතිවිරුද්ධතාවක් ඇති වුවහොත් ඉංග්‍රීසි පාඨය බල පැවැත්විය යුතුය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී,
ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්,
මහාචාර්ය ගාමිණී ලක්ෂ්මන් පීරිස්,
විදේශ අමාත්‍ය.

තුර්කි ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන්,
මෙව්ලුට් චව්ශෝග්ලු,
විදේශ කටයුතු අමාත්‍ය.

EOG 07-0141

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.